**ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ - ලංකා ජෙමොලොජිකල් ලැබෝටරි ප්‍රයිවට් ලිමිටට් සමාගම -2018/2019**

---

ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ ලංකා ජෙමොලොජිකල් ලැබෝටරි ප්‍රයිවට් ලිමිටඩ් සමාගමේ 2018 අප්‍රේල් 01 දින සිට 2019 මාර්තු 31 දක්වා කාලය තුල කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව, මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්තික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) වගන්තිය ප්‍රකාරව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කලයුතු මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් වාර්ෂික හා කාලින මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය. එම පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව සෑම විගණනය කරනු ලබන අස්ථිත්‍යයක් සම්බන්ධයෙන් වාර්ෂික මූල්‍ය ප්‍රකාශ, රීති මඟින් දක්වනු ලැබිය හැකි පරිදිවන කාල සීමාවන් තුල එම අස්ථිත්‍යවල වාර්ෂික කාර්ය සාධන වාර්තාද සමඟ ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයා විසින් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කල යුතුය. එම පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික හා වෙනත් මූල්‍ය ප්‍රකාශන කාලානුරූපව පිළියෙල කිරීම සිදුවන බවට සහතික විය යුතු අතර ඊට අමතරව විගණනය කරනු ලබන අස්ථිත්‍යයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීයා වලබලා ගනු ලැබිය යුතුය.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගනණ පනත සහ 2007 අංක 7 දරන සමාගම් පනතට පහත සඳහන් අවශ්‍යතා සඳහා නිශ්චිත ප්‍රතිපාදන ඇතුලත් වේ.

2007 අංක 7 දරන සමාගම් පනතේ 150 (1) වගන්තිය ප්‍රකාරව සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ශේෂ පත්‍රයේ දින සිට මාස 6 කින් පසුව වගකිව යුතු පුද්ගලයෙකු විසින් මූල්‍ය ප්‍රකාශන සකස් කර සහතික කරන බවට සහතික විය යුතුය.

## 2.1 මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

---------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| 2015, 2016, 2017, 2018 හා 2019 වර්ෂ සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. | සමාගම විසින් පිළිතුරු ලබා දී නැත. | නියමිත දිනට මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමට පියවර ගත යුතුය. |

### 2.1.2 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම පිලිබඳ අභ්‍යන්තර පාලනය

------------------------------------------------------

සාධාරණ සහතිකයක් ලබා දිම සඳහා අභ්‍යන්තර ගිණුම්කරණ පාලන ක්‍රමයන් “ සැලසුම් කිරීම සහ පවත්වාගෙන යාම සඳහා ආයතන අවශ්‍ය කළමනාකරණයේ සාමාන්‍ය හෝ විපරිත ආවරණ අනුව ගනුදෙනු සිදු කිරීම අදාල වාර්තාකරන ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමට අවසර දීම සහ වත්කම් සඳහා වගවීම පවත්වා ගැනීම සඳහා ගනුදෙනු වාර්තා කර ඇති අතර වත්කම්වලට ප්‍රවේශ වීමට අවසර දී ඇතත් කළමනාකරණයේ සාමාන්‍ය හා විශේෂ අවසරය ඇතිව පමණක් වන අතර වත්කම් සඳහා අයකර ගත් පවතින වත්කම සමග සන්සන්දනය කරන්නේ සාධාරන කාල පරාසයක් තුල වන අතර ඕනෑම වෙනසක් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය. සාමාන්‍ය ලෙජරය, ජර්නල් සහ ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ප්‍රධාන ගිණුම් වාර්තා නඩත්තු කිරීම් සම්බන්ධව පවත්නා ගැටලු මෙම මාතෘකාව යටතේ ඇතුලත් විය හැකිය.

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| **පොත් හා ගිණුම් පවත්වා ගෙනයාම**<br>------------------------------------<br>සමාගම විසින් නඩත්තු කල යුතු පහත සඳහන් පොත් හා වාර්තා 2014 අප්‍රේල් 1 සිට 2019 මාර්තු 31 දක්වා කාලය තුල සමාගම විසින් නඩත්තු කර නොතිබුණි.<br>(i) මුදල් / බැංකු පොත්<br>(ii) ලෙජර ගිණුම්.<br>(iii) ජර්නල්ස්.<br>(iv) බැංකු සැසඳුම් ප්‍රකාශන.<br>(v) අදාල ලේඛන.<br>(vi) ගෙවීම් වවුචර්. | සමාගම විසින් පිළිතුරු ලබා දී නැත. | පොත් හා ගිණුම් පවත්වා ගැනීමට වහාම පියවර ගත යුතුය. |

## 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------------

### 2.2.1 ගෙවිය යුතු ශේෂ

--------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| තායිලන්තයේ හා ජර්මනියේ සංචාරයකට අදාලව සභාපති හා අධ්‍යක්ෂකවරයෙකු වෙනුවෙන් රු.369,440 ක් හා රු.1,032,887 ක් ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය විසින් ගෙවා තිබුණි. | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | හිඟ ශේෂය පියවීමට පියවර ගත යුතුය. |

## 2.3 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

------------------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විගණන දිනය දක්වා ආදායම් බදු සඳහා ලියාපදිංචි වීමට හෝ ආදායම් බදු ගෙවීමට පියවර ගෙන නොතිබුණි. 2014 මාර්තු 31 දිනට ගෙවිය යුතු ආදායම් බද්ද හා රඳවා ගැනීමේ බදු ශේෂයන් පිලිවෙලින් රු.14,619,695 ක් හා රු.4,784,831 ක් නිරවුල් කර නොතිබුණි. | සමාගම විසින් පිලිතුරු ලබා දී නැත. | ආදායම් බදු සඳහා ලියාපදිංචි වී ඒ අනුව ආදායම් බදු ගෙවීමට පියවර ගත යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

-------------------------

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශ |
| --- | --- | --- |
| සමාගම 2008 වර්ෂයේදී පිහිටුවා තිබුණි. සමාගමේ සාංගමික සංස්ථා පත්‍රයේ 4 වන ඡේදයේ පහත දැක්වෙන අරමුණු පෙන්වා දී තිබුණද මේ දක්වා කිසිදු මෙහෙයුම් ක්‍රියාකාරකමක් සිදුකර නොතිබුණි. ඒ නිසා සමාගම එම අරමුණු ලගා කරගෙන නොතිබුණි.<br><br>(i) මැණික්, වටිනා සහ අර්ධ වටිනා ගල්, කෘතිම ගල්, ලෝහ, ඛනිජ, ස්වර්ණාභරණ සහ වෙනත් ඕනෑම ද්‍රව්‍යයක් හෝ ඕනෑම දෙයක් සම්බන්ධයෙන් අදහස්, තක්සේරු සහතික, වාර්තා යනාදිය නිකුත් කිරීම සඳහා ජාත්‍යන්තර තත්වයේ රසායනාගාරයක් ශ්‍රී ලංකාවේ ස්ථාපනය කිරීම හා ක්‍රියාත්මක කිරීම.<br><br>(ii) විද්‍යාත්මකව, සාධාරණව සහ අපක්ෂපාතීව ක්‍රියාත්මක වන ආයතනයක් ලෙස දේශීය හා ජාත්‍යන්තර ප්‍රජාවට තම මෙහෙයුම්වල දී එම රසායනාගාරය කෙරෙහි විශ්වාසය තැබීම සඳහා එම රසායනාගාරයේ ස්වාධීනත්වය තහවුරු කිරීම .<br><br>(iii) ශ්‍රී ලංකාවේ මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ශක්තිමත් කිරීම, ධෛර්යමත් කිරීම, සංවර්ධනය කිරීම සහ එම කර්මාන්තයේ කාර්යයන්හි සදාචාරාත්මක මෙහෙයවීම.<br><br>(iv) මැණික් වටිනා හා අර්ධ වටිනා ගල්, කෘතිම ගල්, ලෝහ. ඛනිජ ද්‍රව්‍යය, ස්වර්ණාභරණ සහ වෙනත් ද්‍රව්‍ය හෝ වෙනත් දේවලට අදාළව අධ්‍යාපනික හා පුහුණු පාඨමාලා හා පර්යේෂණ වැඩසටහන් වැනි දෑ පැවැත්වීම. | සමාගම විසින් පිළිතුරු ලබා දී නැත. | සාංගමික සංස්ථා පත්‍රයේ සඳහන් සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට කටයුතු කල යුතුය. |

(v) මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය සඳහා නව තාක්ෂණික ක්‍රම පද්ධති, යන්ත්‍රෝපකරණ උපකරණ. මෙවලම් සහ උපකරණ සංවර්ධනය කිරීම සඳහා පර්යේෂණ සිදුකිරීම.

(vi) සහෝදර සංවිධාන සමඟ අන්‍යෝන්‍ය සබඳතා ඇති කර ගැනීම සහ එවැනි සංවිධාන සමග එක්ව, සහයෝගයෙන් හා එකමුතුව වැඩ කිරීම.